දුරකථන| தொலைபேசிகள்/Telephones :

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — 2484728

පොදු / பொது / General — 2484500, 2484600, 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax — (941) 2473856, (941) 2484869

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහ භාණ්ඩාගාරය
அரச கணக்குகள் திணைக்களம்
பொது திறைசேரி
**Department of State Accounts**
**GENERAL TREASURY**

මගේ අංකය / எனது இல. / My No. — SA/ AS/ 08/ CA-2007

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date — 12/11/ 2007

තැ. පෙ. අංකය 1559, පළමුවන මහල, මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
த. பெ. இல. 1559, முதலாம் மாடி, செயலகம், கொழும்பு 01, இலங்கை.
P. O. Box 1559, 1st Floor, The Secretariat, Colombo 01, Sri Lanka.

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 192 / 2007

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

## 2007 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම

මුදල් රෙගුලාසි 429 අනුව, 2007 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පොත් 2007 දෙසැම්බර් 31 දිනට පියවිය යුතුව ඇත. ඒ අනුව ඔබට අදාල ගිණුම් සාරාංශ, මාරු නියෝග හා අනෙකුත් එවැනි ගිණුම් වාර්තා පහත සඳහන් දිනයන්ට හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ලැබෙන පරිදි නිරවද්‍යව හා විධිමත් ලෙස ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ. එබැවින් සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මෙම චක්‍රලේඛය මගින් නිකුත් කර ඇති උපදෙස් තරයේ පිළිපැදීමත් ඒවාට අනුකූල වීමත් අවධාරණය කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් " අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය බල මණ්ඩලවල වාර්ෂික කාර්ය සාධන වාර්තා සහ ගිණුම් " යන මැයෙන් 2004 පෙබරවාරි 24 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 1/2004 කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

1. **2007 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් පියවීම**

   මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන උපදෙස් පිළිපැදිය යුතුය.

2. **2007 දෙසැම්බර් මාසයේ පළමු ගිණුම් ප්‍රකාශණය නිකුත් කිරීම**

   2:1 2007 දෙසැම්බර් මාසයට අදාල ගිණුම් සාරාංශය, වාර්තා කල හැකි සියළුම ලැබීම් හා ගෙවීම් ඇතුලත් කරමින් 2008 ජනවාරි 11 දින හෝ ඊට පෙර ලැබෙන සේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුවේ.

   2:2 පළාත් බද / දිස්ත්‍රික්ක උප කාර්යාල ඇති දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කර්යාල අදාල සියළුම ලැබීම් හා ගෙවීම් වල විස්තර උපකාර්යාල වලින් ලැබෙන තෙක් පළමු ගිණුම් සාරාංශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ප්‍රමාද නොකල යුතුය. එසේ ප්‍රමාදව ලැබෙන ලැබීම් හා ගෙවීම් අතිරේක සාරාංශයෙහි ඇතුලත් කල හැකි වේ.

2:3 ප්‍රධාන ගිණුම් සාරාංශයේ අතුලත් කිරිමට නොහැකි වූ ලැබීම් හා ගෙවීම් තිබේ නම් ඒවාද, ගිණුම් සැසඳීමේදි අනාවරණය වූ යම් වැරදි ඇතොත් ඒවායේ නිවැරදි කිරීම් ද ඇතුලත්ව සකස් කරන ලද පළමු පරිපූරක ගිණුම් සාරාංශය, 2008 ජනවාරි 18 දින හෝ ඊට පෙර ලැබෙන සේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුවේ. ඒ අනුව 2007 වර්ෂයට අදාල, නමුත් ඒ දක්වා ගිණුම් ගත නොවූ සියළුම ලැබීම්, ගෙවීම් හා වැරදි නිවැරදි කිරීම් පළමු පරිපූරක ගිණුම් සාරාංශයට අතුලත් විය යුතුය.

2:4 දෙසැම්බර් මස ගිණුම් සාරාංශයෙන් වාර්තා කර ඇති පරිදි සියළුම ලැබීම් හා ගෙවීම් ද, වාර්තා වූ සියළු වැරදි නිවැරදි කිරීම ද ඇතුලත් 2007 දෙසැම්බර් මාසය සඳහා වූ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙහි පලමු ගිණුම් ප්‍රකාශනය 2008 ජනවාරි 25 දිනට පෙර http:/www.sad.treasury.gov.lk වෙබ් අඩවිය වෙත මුදා හරිනු ඇත.

2:5 ඔබ විසින් මාසික ගිණුම් සාරාංශ මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වැය ශිර්ෂයන්ට කරන ලද හර කිරීම් තිබේ නම්, අදාල ගිණුම් ප්‍රකාශන පරීක්ෂා කොට, එවැනි ඇතුලත් කිරීම් වහාම නිවැරදි කිරීමට කටයුතු කල යුතුය.

2:6 පලමු වැනි ගිණුම් ප්‍රකාශයන්හි පෙන්නුම් කෙරෙන සංශෝධනය කරන ලද ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන, 2006/12/29 දිනැති අංක 133 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ තුන්වන ජේදයේ සඳහන් සංශෝධිත ප්‍රතිපාදන (ඇමුණුම 1) ලැයිස්තුව අනුව විය යුතුය. මු.රෙ. 66 යටතේ මාරුකිරීම් සහ සලසන ලද පරිපූරක ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන පලමු වැනි ගිණුම් ප්‍රකාශයන්හි ඇතුලත් සංඛ්‍යාවන් සැසඳිය යුතුය. කිසියම් විෂමතාවයක් අනාවරණය වුවහොත් එම විෂමතාවය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දන්වා එය නිවැරදි කරවා ගැනීමට වහාම පියවර ගත යුතුය.

3. <u>2007 දෙසැම්බර් මාසය සඳහා දෙවන හා අවසන් ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම</u>

3:1 සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා පළමු ගිණුම් සාරාංශ මගින් අනාවරණය කර ගන්නා ලද ඕනෑම වරදක් සඳහා වූ නිවැරදි කිරීම් ඇතුලත් කිරීම සඳහා, 2008 පෙබරවාරි 8 දින දක්වා ඉඩ සලසනු ඇත. වැරදි සටහන් නිවැරදි කිරීම සඳහා වූ <u>දෙවන පරිපූරක ගිණුම් සාරාංශය</u> රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් සිදුකල යුතු නිවැරදි කිරීම් වලට අදාල විස්තර ද සමග 2008 පෙබරවාරි 8 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුවේ.

3:2 දෙවන සහ අවසාන ගිණුම් ප්‍රකාශන වල ඇතුලත් විය යුතු මු.රෙ. 69 යටතේ වූ මාරු කිරීම් ඉල්ලම් පත්, ඉහත සඳහන් කරන ලද 2008 පෙබරවාරි 8 දින හෝ ඊට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු වේ. මෙම මු.රෙ.69 මාරු කිරීම් ඉල්ලුම්පත් භාණ්ඩාගාර ලේකම් හෝ භාණ්ඩගාර නියෝජ්‍ය ලේකම් විසින් අනුමත කල යුතු බැවින්, ඒවා 2008 ජනවාරි 29 දින හෝ ඊට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කල යුතුවේ. නිවැරදි කිරීමක්, මාරුපත්‍රයක් හෝ මු.රෙ. 69 මාරු කිරීම් සඳහා වූ අයදුම් පත්‍රයන් සම්බන්ධයෙන් වූ ඉල්ලීමක්, මොනයම් කරුණක් නිසාවත් 2008 පෙබරවාරි 8 දිනට පසු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් භාරගනු නොලැබේ.

3:3 දෙසැම්බර් මාසය සඳහා වූ අවසන් ගිණුම් ප්‍රකාශන 2008 පෙබරවාරි 15 දිනට හෝ ඊට පෙර වෙබ් අඩවිය මගින් නිකුත් කිරීමට කටයුතු යොදනු ලැබේ. මීට සමගාමීව මෙම ගිණුම් ප්‍රකාශන වල දෘඪ පිටපතක් අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් පහත 7 වන ඡේදයේ සඳහන් කර ඇති පටිපාටිය අනුගමනය කරමින්, ලබා ගැනීම පිණිස මෙම දෙපාර්තමේන්තුවේ ගිණුම් සේවා අංශයේ තබනු ඇත.

4. <u>පොදු කරුණු</u>

4:1 ෆැක්ස් මාර්ගයෙන් සහ ඡායා පිටපතත් වශයෙන් එවනු ලබන ගිණුම් සාරාංශ / මාරු නියෝග පිළිගනු නොලැබේ.

4:2 වැරදි සටහන් නිවැරදි කිරීම සඳහා අමාත්‍යාංශ, "ඒ " පංතියේ දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් පරිපූරක ගිණුම් සාරාංශය යොදාගත යුතුය.

4:3 දෙසැම්බර් මාසය සඳහා වූ ප්‍රධාන ගිණුම් සාරාංශයෙන් පසුව ගිණුම් ගත නොවූ අයිතමයන් හා වැරදි සටහන් නිවැරදි කිරීමට ඉදිරිපත් කරනු ලබන පරිපූරක ගිණුම් සාරාංශ *"2007 දෙසැම්බර් පරිපූරක "* යන මැයෙන් ඉදිරිපත් කළ යුතුය.

4:4 මාසික ගිණුම් සාරාංශ ඩිස්කට් (Diskettes) මගින් ඉදිරිපත් කරන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල, තම පරිපූරක ගිණුම් සාරාංශ ද ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කල යුතු අතර එම ඩිස්කට් *" 2007 දෙසැම්බර් පරිපූරක "* වශයෙන් සටහන් කර ඉදිරිපත් කළ යුතුය. සියළුම වැරදි සටහන් නිවැරදි කිරීම් හා මාරු කිරීම් මෙම ඩිස්කට්හි ඇතුලත් කල යුතු අතර, මාරු නියෝග දෘඪ පිටපත් භාරගනු නෙලැබේ.

4:5 බී පංතියේ දෙපාර්තමේන්තු විසින් රාජ්‍ය ගිණුම් දෙපාර්ත්මේන්තුවට එවනු ලබන සෑම මාරු පත්‍රයකම උඩ වම් කෙලවරෙහි <u>"2007 මුදල් වර්ෂය - මුල් පිටපත"</u> යන්න සඳහන් කළ යුතු වේ. අතිරේක පිටපත් ඉදිරිපත් නොකල යුතුය. අමතර පිටපත් එවීම හේතුවෙන් සිදුවන ද්විත්ව ගණනයන් සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වග කියනු නොලැබේ.

4:6 අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් සේවය ලබා ගන්නා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඇණවුම් භාරදීමේදී, ඒවාට අදාල බිල්පත් නොපමාව ලබාගෙන 2007 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර ගිණුම් ගත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

4:7 ගිණුම් පියවීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව කර ගෙන යාම පිණිස වෙනත් වැය ශීර්ෂ වලට සිදු කරන ලද හර / බැර කිරීම් පිළිබඳ විස්තර අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අප්‍රමාදව සැපයිය යුතුය.

5. මූල්‍ය ප්‍රතිපාදන තැන්පත් ගිණුම් වලට මාරු කිරීම පිණිස අවසර දෙනු නොලැබේ. කෙසේ වුවද විශේෂ වූ අවස්ථාවක් යටතේ මූල්‍ය ප්‍රතිපාදන තැන්පත් ගිණුම් වලට මාරු කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගුණහොත් පමණක් ප්‍රධාන ගණන් දීමේ නිළධාරීන් සහ ගණන් දීමේ නිළධාරීන් මු.රෙ. 215 හි විධි විධාන අනුව කටයුතු කල යුතු වේ. තැන්පත් ගිණුම් වලට මාරු කිරීම් පිණිස කරනු ලබන සියළුම ඉල්ලීම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා මෙම දෙපාර්තමේන්තුවට එවිය යුතු අතර එවන් ඉල්ලීම් භාණ්ඩාගාරයේ දැඩි පරීක්ෂාවට ලක්වන අතර අනුමත කරනු ලබන ඉල්ලීම් සඳහා පමණක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් තැන්පත් ගිණුම් අංක ලබා දෙනු ඇත.

අනුමැතිය ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ලිඛිතව දැනුම් දෙනු ලැබේ. එවැනි ඉල්ලීම් සියල්ල 2008 ජනවාරි 11 වැනි දිනට පෙර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරීන්ගේ වගකීම වේ. ජනවාරි 11 වැනි දිනෙන් පසු ලැබෙන එවැනි ඉල්ලීම් කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ. එමෙන්ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කර්යාල වල දැනට පවත්වා ගෙන යනු ලබන විවිධ තැන්පත් ගිණුම් වලට භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, මෙම මූල්‍ය ප්‍රතිපාදන මාරු කිරීමට අවසර නොදෙන බව ද සැළකිල්ලට ගත යුතුය.

6. තවද 2008 පෙබරවාර 8 දින හෝ ඊට පෙර දෙවන පරිපූරක ගිණුම් සාරාංශයෙහි වැරදි නිවැරදි කිරීම් වලට අදාල සියළුම සටහන් ඇතුලත් කිරීමට හැකි උපරිම උත්සාහයක් දැරිය යුතු අතර වැරදි නිවැරදි කිරීම සඳහා වූ මාරු නියෝග සඳහා මෙම දෙපර්තමේන්තුව මගින් වගකීම භාරගනු නොලැබේ.

7. නිසි ලෙස අත්සන් යෙදූ අවසාන ගිණුම් ප්‍රකාශන අස්ථාන ගතවීම වලක්වනු පිණිස යම් බලයලත් නිළධාරියෙක් අදාල ලේඛණ භාර ගැනීම පිණිස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඒ සම්බන්ධයෙන් වූ ලිපියක් ද සමග එවීමට කටයුතු යොදන මෙන් සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කර්යාල වලින් ඉල්ලා සිටිනු ලැබේ. මෙම දෙපර්තමේන්තුව වෙත නිළධාරියෙක් එවීමට අපහසු යම් ආයතනයක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් දැනුම් දීමක් සිදුකල විට එම ලේඛණ තැපැල් කර එවීමට කටයුතු කල හැකිය.

8. ගිණුම් පියවීමේ ක්‍රියාවලිය ඉහත විස්තර කර ඇති පරිදි බාධාවකින් තොරව පවත්වා ගෙන යන බවට සහතික වීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරි / ගණන්දීමේ නිළධාරි විසින් පත් කරන ලද නිළධාරියාගේ වගකීම වේ.

9. ගිණුම් පියවීම සම්බන්ධව තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍යවන්නේ නම් පහත සඳහන් නිළධාරීන්ට අමතන ලෙසට දනුවනු කැමැත්තෙමි.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ (ගිණුම් සේවා) | - | 2484733 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු සැකසුම්) | - | 2484735 |
| සහකාර අධ්‍යක්ෂ (දත්ත සැකසුම්) | - | 2484736 |
| සහකාර අධ්‍යක්ෂ (ගිණුම් සේවා) | - | 2484737 |

10. ගිණුම් පියවීමේ ක්‍රියාවලිය නිම කිරීමට ප්‍රථම භාණ්ඩාගාර පොත්වල පෙන්නුම් කෙරෙන එක් එක් දෙපාර්තමේන්තු විසින් මෙහෙයවනු ලබන තැන්පතු සහ අත්තිකාරම් ගිණුම්වල අවසාන ශේෂයන් හා දෙපාර්තමේන්තු පොත්වල පෙන්නුම් කෙරෙන ශේෂයන් අතර විෂමතාවයන් නොමැති බවට තහවුරු කර ගන්නා ලෙසට තවදුරටත් ඉල්ලා සිටිනු ලැබේ.

11. මේ සමග අමුණා ඇති කාලසටහනෙහි සඳහන් කර ඇති ඉලක්ක දිනයන්ට පෙර ගිණුම් පියවීමේ කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා ඔබගෙන් ලැබෙන කාරුණික සහයෝගය මහත් සේ අගය කරමි.

දයානන්ද විදානගමච්චි
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත්:-
1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාරතමේන්තුව
4. අධ්‍යක්ෂ - ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව.

## 2007 මුදල් වර්ෂය සඳහා ගිණුම් පියවීමට අදාල
## විවිධ කාර්යයන් සඳහා නිශ්චිත අවසාන දිනයන්

❖ මුදල් පොත පියවීම - 2007 දෙසැම්බර් 31 දින

❖ මූල්‍ය ප්‍රතිපාදන තැන්පත් ගිණුමට මාරු කිරීම සඳහා වන ඉල්ලීම - 2008 ජනවාරි 11 දින හෝ ඊට පෙර

❖ 2007 දෙසැම්බර් මාසයට අදාල ගණුදෙනු ඇතුලත් ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම - 2008 ජනවාරි 11 දින හෝ ඊට පෙර

❖ 2007 දෙසැම්බර් මාසයට ගිණුම් සාරාංශ ඇතුලත් පළමු පරිපූරක ගිණුම් සාරාංශය නිකුත් කිරීම - 2008 ජනවාරි 18 දින හෝ ඊට පෙර

❖ 2007 දෙසැම්බර් මාසයට අදාල ගිණුම් සාරාංශ ඇතුලත් පළමු ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම - 2008 ජනවාරි 25 දින හෝ ඊට පෙර

❖ අවසාන ගිණුම් ප්‍රකාශන් වල ඇතුලත් විය යුතු මු.රෙ.69 අයදුම් පත්‍ර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම - 2008 ජනවාරි 29 දින හෝ ඊට පෙර

❖ පළමු ගිණුම් ප්‍රකාශන අනුව ගන්නා ලද වැරදි නිවැරදි කිරීම් ඇතුලත් දෙවන පරිපූරක ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම - 2008 පෙබරවාරි 08 දින හෝ ඊට පෙර

❖ අනුමත මු.රෙ. 69 මාරු පත්‍ර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තතුව වෙත භාර දීම - 2008 පෙබරවාරි 08 දින හෝ ඊට පෙර

❖ අවසන් ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම - 2008 පෙබරවාරි 15 දින හෝ ඊට පෙර